සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.05 / 0830 - 1030

ක්‍රිස්තියානි ධර්මය I
கிறிஸ்தவம் I
Christianity I

43 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, පිළිපදින්න.
* 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** බැබිලෝනියානු විප්‍රවාසය සමයෙහි ජුදා ජනතාව හුරු වූ භාෂාව වූයේ,
(1) ග්‍රීක භාෂාවයි. (2) හෙබ්‍රෙව් භාෂාවයි. (3) ඇරමයික් භාෂාවයි.
(4) ලතින් භාෂාවයි. (5) මැසරොටික් භාෂාවයි.

**2.** 'ජොහනීය දේහය' යන ග්‍රන්ථවලට අයත් **නොවන** ග්‍රන්ථයක් වන්නේ,
(1) හෙබ්‍රෙව් හසුන ය. (2) 1 ජොහන් ය.
(3) ජොහන් ශුවිශේෂය ය. (4) එළිදරව්ව ග්‍රන්ථය ය.
(5) 2 ජොහන් ය.

**3.** 'ටෝරා' යන හෙබ්‍රෙව් වචනයේ අර්ථය කුමක් ද?
(1) සම්ප්‍රදාය (2) ව්‍යවස්ථාව (3) භූමිය (4) කතුවැකිය (5) කෘතිය

**4.** දහනව වන ශත වර්ෂය තෙක්ම පංච පුස්තකයේ කතෘත්වය හිමිව තිබුණේ කවරෙකු හට ද?
(1) පේදුරුතුමාට (2) ආබ්‍රහම්තුමාට (3) ඊසාක්තුමාට
(4) මෝසෙස්තුමාට (5) ජෝෂුවාතුමාට

**5.** ජනවන්දනා වත්පිළිවෙත්වලට හා පූජක චාරිත්‍ර-වාරිත්‍රවලට විශේෂ තැනක් දී ඇත්තේ,
(1) D සම්ප්‍රදායෙහි ය. (2) E සම්ප්‍රදායෙහි ය.
(3) J සම්ප්‍රදායෙහි ය. (4) P සම්ප්‍රදායෙහි ය.
(5) Y සම්ප්‍රදායෙහි ය.

**6.** දෙවියන් වහන්සේ ආබෙල්ගේ පඬුර තෝරාගැනීම තුළින් පෙන්නුම් කරන්නේ කුමක් ද?
(1) ඊර්ෂ්‍යාව ඇති වී මිනී මැරීමක් සිදු වී ඇති බව ය.
(2) පව්කාරයාට ඕනෑම වේලාවක කමාව ලැබෙන බව ය.
(3) දෙවියන් වහන්සේ කැමති අයව නිදහස් කැමැත්ත තුළ තෝරාගන්නා බව ය.
(4) දෙවියන් වහන්සේ ආබෙල් සහ කායින් දෙදෙනාට ම දඬුවම් නියම කළ බව ය.
(5) දෙවියන් වහන්සේට පඬුරු අත්‍යවශ්‍ය බව ය.

**7.** ක්‍රිස්තුන් වහන්සේගේ පූර්ව සලකුණක් වූයේ කවුරුන් ද?
(1) කායින් (2) ඊසාක් (3) ඉස්කාර් (4) රූබන් (5) සාවුල්

**8.** මිසරවාසීන් මුහුණ දුන් වසංගත කිහිපයක් පහත දැක්වේ.

A - කිනිතුලු උවදුර
B - ගව සම්පත් වැනසීම
C - පළඟැටි උවදුර
D - ගඩු උවදුර
E - ගෙම්බන් උවදුර
F - කුළුඳුලන් මැරීම

මේවා අතුරෙන් පාරාවෝ සමග ගනුදෙනුවකින් තොරව මෝසෙස් හා ආරොන් එක්ව ඇති කළ උවදුරු වන්නේ,
(1) A, B හා D ය. (2) A, C හා F ය. (3) A, D හා E ය. (4) A, E හා F ය. (5) C, D හා E ය.

**9.** 'ගෝයි කඩොෂ්' යන හෙබ්‍රෙව් යෙදුමේ තේරුම කුමක් ද?
(1) පූජක රාජ්‍යය යන්න ය.
(2) නිදහස් ජාතිය යන්න ය.
(3) දෙවියන් වහන්සේගේ සම්පත යන්න ය.
(4) විශේෂ වරප්‍රසාදය යන්න ය.
(5) වෙන් කරන ලද ජාතිය යන්න ය.

**10.** ගෝත්‍රිකව ජීවත් වූ ඉශ්රායෙල් ජනතාව සදාචාර සම්පන්න ජාතියක් බවට පත් වූයේ,
(1) භාග්‍ය අටට පක්ෂපාතී වීමෙනි. (2) සීනයි ගිවිසුමට පක්ෂපාතී වීමෙනි.
(3) බාල් දෙවිවරුන් ඇදහීමෙනි. (4) දේශපාලන බලපෑමෙනි.
(5) සමාජ බලපෑමෙනි.

**11.** පහත ප්‍රකාශ සලකන්න.

A - ධ්‍යානයට සම වැදීම
B - කණ්ඩායම් වශයෙන් දූත මෙහෙවරෙහි යෙදීම
C - වැරදි විනිශ්චය කිරීම
D - අධිකාරි බලයෙන් සන්නද්ධ කිරීම
E - තම දූත මෙහෙවර සනාථ කිරීම සඳහා හාස්කම් කිරීම

මේවායින් පැරණි දිවැසිවරුන්ගේ දූත මෙහෙවරෙහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ මොනවා ද?
(1) A, B හා C ය. (2) A, B හා E ය. (3) A, C හා D ය. (4) A, D හා E ය. (5) B, C හා D ය.

**12.** ප්‍රසිද්ධියේ නොපෙනුනත්, සමාජය තුළ සැඟවුණු අසාධාරණකම් පිළිබඳ ව කථා කළ දිවැසිවරයා වන්නේ,
(1) යෙසායා ය. (2) ජෙරමියා ය. (3) ආමෝස් ය. (4) එසකියෙල් ය. (5) මීකා ය.

**13.** දෙවියන් වහන්සේගේ ආදරයේ දිවැසිවරයා වන්නේ,
(1) යෙසායා ය. (2) ආමෝස් ය. (3) එසකියෙල් ය. (4) හොසියා ය. (5) ජෙරමියා ය.

**14.** ධර්මිෂ්ට ජීවිතයක් ගත කිරීම සඳහා ජනතාව දිරිගන්වන ඉගැන්වීම් අන්තර්ගත ගීත හඳුන්වන්නේ,
(1) විලාප ගීත යනුවෙනි. (2) රාජකීය ගීත යනුවෙනි.
(3) විශ්වාසයේ ගීත යනුවෙනි. (4) ප්‍රඥා ගීත යනුවෙනි.
(5) ප්‍රශංසා ගීත යනුවෙනි.

**15.** අභිධාර්මික ප්‍රඥාවට කදිම නිදසුන් වන ග්‍රන්ථ මොනවා ද?
(1) ජෝබ්ගේ පොත හා ධර්මදේශකයා (2) ජෝබ්ගේ පොත හා ගීතාවලිය
(3) ප්‍රේම ගී සහ හිතෝපදේශය (4) ජෝබ්ගේ පොත හා සලමොන්ගේ ප්‍රඥාව
(5) ධර්මදේශකයා හා ගීතාවලිය

**16.** පහත ප්‍රකාශ සලකන්න.

A - උත්තම පූජකයා ඇතුළුව සාමාජිකයන් ගණන හැත්තෑ එකකි.
B - මෝසෙස්තුමාගේ නීතිය අනුව විනිශ්චය සිදු විය.
C - ආගමික මංගල්‍යය සැමරීම සිදු විය.
D - විශේෂ ඇඳුමකින් සැරසී පැමිණිය යුතු විය.

ඉහත ප්‍රකාශ අතුරෙන් 'සැන්හෙඩ්‍රින්' සභාවට අදාළ කරුණු මොනවා ද?
(1) A හා B ය. (2) A හා C ය. (3) A හා D ය. (4) B හා C ය. (5) C හා D ය.

[ඉන්වැනි පිටුව බලන්න

**17.** මෙසියානු ආගමනය යම් දිනක සිදුවන තුරු බලා නොසිට ඒ දිනය උදා කරගැනීමට විවිධ කැරලි ඇති කළ පිරිසක් වන්නේ,
(1) එසේනිවරුන් ය. (2) සද්දිසිවරුන් ය. (3) සෙලට්වරුන් ය.
(4) පරිසිවරුන් ය. (5) විනයධරයන් ය.

**18.** රෝම සොල්දාදුවන් විසින් ජෙරුසලම විනාශ කිරීමට මද කලකට පෙර රෝමයේ දී ලියවුණු බවට විශ්වාස කරන ග්‍රන්ථය කුමක් ද?
(1) ශුද්ධ වූ ලූක් ශුභාරංචිය (2) ශුද්ධ වූ මතෙව් ශුභාරංචිය
(3) ශුද්ධ වූ ජොහන් ශුභාරංචිය (4) ශුද්ධ වූ මාක් ශුභාරංචිය
(5) අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත

**19.** ප්‍රථම වතාවට 'ක්‍රිස්තියානි' යන නාමයෙන් ශ්‍රාවකයන් හඳුන්වනු ලැබුවේ,
(1) පම්පිලියේ පර්ගායේ දී ය. (2) සිරියාවේ අන්තියෝකියේ දී ය.
(3) ඉකෝනියේ ධර්මශාලාවේ දී ය. (4) පිසිදියේ අන්තියෝකියේ දී ය.
(5) ලූස්ත්‍රාවේ ධර්මදූත චාරිකාවේ දී ය.

**20.** ශුද්ධ වූ පාවුලුතුමා තිමෝතියස්ට ලියන ලද දෙවන හසුනේ තේමාව වන්නේ,
(1) ක්‍රිස්තුන් වහන්සේට සේවය කරන්නාට දුක් කරදර සිදුවන බව ය.
(2) කිතුනුවකුවීම සඳහා ජාතිය වැදගත් නො වන බව ය.
(3) ක්‍රිස්තුන් වහන්සේ පරම ශ්‍රේෂ්ඨත්වය වන බව ය.
(4) දෙවියන් වහන්සේගේ අනන්ත කරුණාව නිසා ගැළවීම ලැබෙන බව ය.
(5) ඉවසීමෙන් දූත කාර්යයයේ යෙදිය යුතු බව ය.

**21.** දේව මාළිගයේ තිරය දෙකඩවීමෙන් සංකේතවත් කරනුයේ,
(1) ක්‍රිස්තුන් වහන්සේගේ සන්තාපය ප්‍රකාශ වන බවයි.
(2) දෙවියන් වහන්සේ වෙතට යන මාර්ගය ක්‍රිස්තුන් වහන්සේ විවෘත කර දීමයි.
(3) දෙවියන් වහන්සේගේ වැඩ සිටීම සැක සහිත බවයි.
(4) උත්ථානය සිදුවන බව කලින් දැනුම් දීමක් බවයි.
(5) පාරිසරික වෙනස්කම් මගින් උත්ථානයේ පණිවිඩය ප්‍රකාශ වන බවයි.

**22.** ශුද්ධ වූ පාවුලුතුමා ප්‍රේමය සඳහා යොදාගනු ලබන 'අගාපේ' යන වචනයෙන් අදහස් කරනුයේ කුමක් ද?
(1) ලෞකික හෝ ලෝකෝත්තර හැකියාවෙන් පූර්ණ වීමයි.
(2) ශරීරය දවන යාග පූජාවක් ලෙස ඔප්පු කිරීමයි.
(3) ප්‍රතිලාභ නොතකා අයහපත කරන අයට යහපත කිරීම හා පැතීමයි.
(4) විශ්වාසයෙන් හා බලාපොරොත්තුවෙන් යුතුව සියලු දේ පරිත්‍යාග කිරීමයි.
(5) හරි දේ ගැන ප්‍රීති වීම හා අනුන්ගේ වරද ගැන ප්‍රීති නොවීමයි.

**23.** "ගෘහස්ත පාලනයේ දී භාර්යාව ස්වාමි පුරුෂයාට යටත් විය යුතු අතර, ස්වාමියා සිය භාර්යාව සමග කටයුතු කිරීමේ දී කරුණාවෙන් කළ යුතු ය." යනුවෙන් ශුද්ධ වූ පාවුලුතුමා පවසන්නේ,
(1) එපීස සංඝයට ය. (2) කොරින්ති සංඝයට ය.
(3) පිලිප්පි සංඝයට ය. (4) ගලාති සංඝයට ය.
(5) රෝම සංඝයට ය.

**24.** දෙමාපියන්ට නිසි ලෙස දිය යුතු ගෞරවය, සැලකිල්ල හා ආදරය දැක්වීම මගින්,
(1) දරුවන් යුතුකම් හා වගකීම් ඉටු කරන බව පෙන්වා දෙයි.
(2) තමාගේ මෙන් ම අන් අයගේ ද ගැළවීම සලස්වා ගනියි.
(3) ක්‍රිස්තුන් වහන්සේගේ ගැළවීමේ සැලැස්මට පංගුකාර වේ.
(4) දීර්ඝායුෂ ලැබෙන බව දස පනත පෙන්වා දෙයි.
(5) කරන සෑම දෙයක්ම සාර්ථක වන බව පෙන්වා දෙයි.

**25.** පිලිප්පි 2 : 5 - 11 ලිපියෙන් පෙන්වා දෙන ක්‍රිස්තු ජීවිතයේ කැපී පෙනෙන ගුණාංග වන්නේ,
(1) පරිශුද්ධතාව හා කීකරුකම ය. (2) බැහැපත්කම හා ප්‍රේමය ය.
(3) ප්‍රේමය හා කීකරුකම ය. (4) දිළිඳුකම හා කීකරුකම ය.
(5) බැහැපත්කම හා කීකරුකම ය.

26. ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රධාන ඉගැන්වීමක් වන "නායකයා සේවකයා විය යුතු බව" ක්‍රියාවෙන් ඔප්පු කළේ කුමන අවස්ථාවේ දී ද?
(1) මල් උයනේ යැදුමේ දී ය.
(2) බෞතීස්මයේ දී ය.
(3) අන්‍යරූප විලාසයේ දී ය.
(4) අන්තිම රාත්‍රී භෝජනයේ දී ය.
(5) ස්වර්ගාරෝහණයේ දී ය.

27. "ඔබගේ පූජාව නිර්මල පූජාවක් වනු පිණිස පළමුව ඔබේ පාපොච්චාරණයකින් පසුව එක් වී රොටි කඩා ස්තුති දෙන්න" යනුවෙන් සඳහන් වන්නේ,
(1) අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතෙහි ය.
(2) ඩිඩාකේ ග්‍රන්ථයෙහි ය.
(3) 1 කොරින්ති හසුනෙහි ය.
(4) කතෝලික සභා ධර්මෝපදේශ ග්‍රන්ථයෙහි ය.
(5) සසුන් නීති සංග්‍රහයෙහි ය.

28. දියෝක්ලේසියානු අධිරාජ්‍ය පීඩන සමය තුළ ප්‍රාණ පරිත්‍යාගීවූවන් කවුරුන් ද?
(1) ශුද්ධ වූ සෙබස්තියන්තුමා, ශුද්ධ වූ ලෝරන්ස්තුමා සහ ශුද්ධ වූ ඇග්නස්තුමිය
(2) ශුද්ධ වූ ලෝරන්ස්තුමා, ශුද්ධ වූ සිසිලියාතුමිය සහ ශුද්ධ වූ පොලිකාප්තුමා
(3) ශුද්ධ වූ ඇග්නස්තුමිය, ශුද්ධ වූ සෙබස්තියන්තුමා සහ ශුද්ධ වූ ලුසියාතුමිය
(4) ශුද්ධ වූ ෆිලික්ස් පාප් තුමා, ශුද්ධ වූ ජස්ටින්තුමා සහ ශුද්ධ වූ සිසිලියාතුමිය
(5) ශුද්ධ වූ ජස්ටින්තුමා, ශුද්ධ වූ ඇග්නස්තුමිය සහ ශුද්ධ වූ ලුසියාතුමිය

29. තර්කවේදීන් අතර දක්ෂතම තර්කවේදියා කවුරුන් ද?
(1) මහා ග්‍රෙගරිතුමා ය.
(2) ශුද්ධ වූ අම්බ්‍රෝස්තුමා ය.
(3) ශුද්ධ වූ අගුස්තීනුතුමා ය.
(4) මහා බැසිල්තුමා ය.
(5) ශුද්ධ වූ ජස්ටින්තුමා ය.

30. අටවන බොනිපස් ශුද්ධෝත්තම පියතුමන් විසින් මහා සභා පියවරුන් ලෙස නම් කරන ලද්දේ,
(1) ශුද්ධ වූ ජෙරොම්තුමා, ශුද්ධ වූ අගොස්තීනුතුමා, ශුද්ධ වූ අම්බ්‍රෝස්තුමා සහ ශුද්ධ වූ ග්‍රෙගරිතුමා ය.
(2) ශුද්ධ වූ ග්‍රෙගරිතුමා, ශුද්ධ වූ මහා බැසිල්තුමා, ශුද්ධ වූ ජෙරොම්තුමා සහ ශුද්ධ වූ අතනාසියස්තුමා ය.
(3) ශුද්ධ වූ ජෝන් ක්‍රිසොස්තම්තුමා, ශුද්ධ වූ ග්‍රෙගරිතුමා, ශුද්ධ වූ ජෙරොම්තුමා සහ ශුද්ධ වූ අගොස්තීනුතුමා ය.
(4) ශුද්ධ වූ පොලිකාප්තුමා, ශුද්ධ වූ ඉග්නාසියස්තුමා, ශුද්ධ වූ ග්‍රෙගරිතුමා සහ ශුද්ධ වූ ජෙරොම්තුමා ය.
(5) ශුද්ධ වූ අම්බ්‍රෝස්තුමා, ශුද්ධ වූ ග්‍රෙගරිතුමා, ශුද්ධ වූ පොලිකාප්තුමා සහ ශුද්ධ වූ ජෙරොම්තුමා ය.

31. ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේගේ තවත් මැවිල්ලක් බව ප්‍රකාශ කළ වේද භේදය හඳුන්වනුයේ,
(1) ඒරියන් ලෙස ය.
(2) නෙස්ටෝරියන් ලෙස ය.
(3) එවිටිකියන් ලෙස ය.
(4) මොනිපිටියන් ලෙස ය.
(5) පිලාජියානු ලෙස ය.

32. ක්‍රි.ව. 431 දී එපීස මන්ත්‍රණ සභාව පවත්වනු ලැබුවේ කුමන හේතුව නිසා ද?
(1) අප්‍රධානතාවාදයට පිළිතුරු දීම සඳහා ය.
(2) නෙස්ටෝරියානු වේද භේදයට පිළිතුරු දීම සඳහා ය.
(3) එවිටිකියන් වේද භේදයට පිළිතුරු දීම සඳහා ය.
(4) ඒරියන් වේද භේදයට පිළිතුරු දීම සඳහා ය.
(5) මොනිපිටියානු වාදයට පිළිතුරු දීම සඳහා ය.

33. 'කතෝලික සභාවේ සාම්ප්‍රදායික ඇදහිල්ලේ පියා' ලෙස හඳුන්වන්නේ,
(1) ශුද්ධ වූ ජෙරොම්තුමා ය.
(2) ශුද්ධ වූ ජස්ටින්තුමා ය.
(3) ඇලෙක්සැන්ඩ්‍රියාවේ ශුද්ධ වූ අතනාසියස්තුමා ය.
(4) ඇලෙක්සැන්ඩ්‍රියාවේ ශුද්ධ වූ සිරිල්තුමා ය.
(5) ටර්ටුලියන් ය.

**34.** දිව්‍ය පූජාවේ උච්චාරණය කරනු ලබන විශ්වාස ලක්ෂණය සභාවේ වේද සත්‍යතා බවට පිළිගත් මන්ත්‍රණ සභාව වූයේ,
(1) ජෙරුසලම් මන්ත්‍රණ සභාව ය. (2) නිසියානු මන්ත්‍රණ සභාව ය.
(3) කැල්සිඩොන් මන්ත්‍රණ සභාව ය. (4) එපීස මන්ත්‍රණ සභාව ය.
(5) කොන්ස්තන්තිනෝපල් මන්ත්‍රණ සභාව ය.

**35.** ඇට්ටිල්ලා නමැති 'හන්' ගෝත්‍රික නායකයාගේ පහරදීම්වලින් රෝමය ආරක්ෂා කරගැනීමට පුරෝගාමී වූයේ,
(1) මහා ග්‍රෙගරි පාප්තුමා ය. (2) I වන ලියෝ පාප්තුමා ය.
(3) II වන සිල්වෙස්ටර් පාප්තුමා ය. (4) XII වන ජෝන් පාප්තුමා ය.
(5) ශුද්ධ වූ බොනිපස්තුමා ය.

**36.** 'ක්‍රිස්තියානි ධර්මායතනය' නමැති ග්‍රන්ථය ප්‍රකාශයට පත් කරන ලද්දේ,
(1) මාටින් ලූතර්තුමා විසිනි. (2) ජෝන් වෙස්ලිතුමා විසිනි.
(3) විලියම් බූත්තුමා විසිනි. (4) උල්රිච් ස්වින්ග්ලිතුමා විසිනි.
(5) ජෝන් කැල්වින්තුමා විසිනි.

**37.** ක්‍රි.ව. 1054 දී පෙරදිග සභාව කතෝලික සභාවෙන් වෙන් වී ග්‍රීක් ඕර්තඩොක්ස් සභාව බිහිවීමට හේතු වූයේ,
(1) දේව ප්‍රසාද නිධාන ප්‍රතික්ෂේප කිරීමයි. (2) ශුද්ධ වූ බයිබලය ප්‍රතික්ෂේප කිරීමයි.
(3) දිව්‍ය පූජාව ප්‍රතික්ෂේප කිරීමයි. (4) එක ම සභාවක් යන දේව අභිමතයට පිටුපෑමයි.
(5) පූර්ණ එලවලට පිටුපෑමයි.

**38.** "දේව ධර්මය යනු අවබෝධය සොයා යන ඇදහිල්ලකි." මෙලෙස හඳුන්වා දෙනු ලැබුවේ,
(1) කැන්ටබරි හි ඇන්සලම්තුමා විසිනි. (2) පීටර් ලොම්බාර්ඩ්තුමා විසිනි.
(3) අගොස්තීනුතුමා විසිනි. (4) මාටින් ලූතර් විසිනි.
(5) ජෝන් කැල්වින් විසිනි.

**39.** කාර්මෙල් නිකායේ තාපස ජීවිතය එංගලන්තයට හඳුන්වා දෙන ලද්දේ,
(1) ශුද්ධ වූ සයිමන් ස්ටොක් ය. (2) අවිලාහි තෙරේසාතුමිය ය.
(3) කුරුසියේ ජොහන්තුමා ය. (4) අසීසියේ ප්‍රැන්සිස්තුමා ය.
(5) පීටර් කැනීසියස්තුමා ය.

**40.** දහවන සියවසේ දී ශුද්ධ වූ සභාවේ සුඛෝපභෝගී ජීවිතය විවේචනය කර ශුද්ධ වූ සභාවට දිළිඳුකම හඳුන්වාදීමට පුරෝගාමී වූයේ,
(1) ක්ලූනිවරුන් ය. (2) සිස්ටර්සියන්වරුන් ය. (3) බෙනදිකානුවරුන් ය.
(4) ලූතරන්වරුන් ය. (5) වැල්දේසිවරුන් ය.

**41.** කුරුසියේ ජුවාම්තුමා විසින් රචිත ග්‍රන්ථයක් **නො වන්නේ,**
(1) කාර්මෙල් පර්වතය නැගීම වේ. (2) ආත්මයේ අඳුරු රාත්‍රිය වේ.
(3) පූර්ණ දිවියකට මග වේ. (4) ආධ්‍යාත්මික ගීතය වේ.
(5) ප්‍රේමයේ ජීවන ඇල්ල වේ.

**42.** සීගිරි සමයේ ඉන්දියාවෙන් පැමිණි මිගාර සෙන්පතියා කිතුනුවකුය යන මතය ඉදිරිපත් කරනු ලැබුයේ,
(1) අබුසයිද් මහතා විසිනි. (2) ඒ.ආර්. අයර්ටන් මහතා විසිනි.
(3) සෙනරත් පරණවිතාන මහතා විසිනි. (4) බෙන්ජමින් රබායි මහතා විසිනි.
(5) ලෙනාඩ් වුල්ෆ් මහතා විසිනි.

**43.** 'පද්‍රෝ ආදෝ' හෙවත් සභා ආරක්ෂක භාරය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ පාප්තුමා කවුරුන් ද?,
(1) V වන පියුස් පාප්තුමා ය. (2) V වන ඇලෙක්සැන්ඩර් පාප්තුමා ය.
(3) VI වන ඇලෙක්සැන්ඩර් පාප්තුමා ය. (4) IX වන පියුස් පාප්තුමා ය.
(5) XIII වන ලියෝ පාප්තුමා ය.

**44.** ධර්මපාල රජු 1557 දී කතෝලික දහම වැළඳ ගත්තේ කිනම් නාමයෙන් ද?
(1) මායාදුන්නේ යන නමින් ය. (2) දොන් ජුවම් ධර්මපාල යන නමින් ය.
(3) ජුවන් ද විලා යන නමින් ය. (4) රයිගම් බණ්ඩාර යන නමින් ය.
(5) අන්තෝනියෝ යන නමින් ය.

**45.** පෘතුගීසි සමයේ කතෝලික ධර්මදූතවරුන්ගේ ධර්මදානීය කටයුතු පහසුවෙන් කරගත හැකි වූයේ ඔවුන් තුළ පැවැති කුමන ලක්ෂණයක් නිසා ද?
(1) බුද්ධිමත් භාෂා ඥානය
(2) සරළ ජීවිත පැවැත්ම
(3) වැඩ වසම් ක්‍රමය
(4) සමාජ ජීවිත පැවැත්ම
(5) මූල්‍යමය පහසුකම් සැලසීම

**46.** ශුද්ධ බයිබලය සිංහල භාෂාවට පරිවර්තනය සහ ජනයා අතර ව්‍යාප්ත කිරීම ආරම්භ වූයේ කිනම් පාලන සමයේ දී ද?
(1) පෘතුගීසි
(2) ඉංග්‍රීසි
(3) සිංහල
(4) දමිළ
(5) ලන්දේසි

**47.** ශ්‍රී ලංකාවේ පළමු කන්‍යාරාම පාසල ආරම්භ කළ පැවිදි නිකාය වන්නේ,
(1) සුරදූති පැවිදි නිකායයි.
(2) අපොස්තලික කාර්මෙල් පැවිදි නිකායයි.
(3) ශුද්ධ වූ පවුලේ පැවිදි නිකායයි.
(4) යහපත් එඬේරාගේ පැවිදි නිකායයි.
(5) මරියතුමියගේ ප්‍රැන්සිස්කාන පැවිදි නිකායයි.

**48.** මානව සංවර්ධනය සඳහා 'පොදු යහපත' ඇති කිරීමේ අවශ්‍යතාව දෙවන වතිකාන ප්‍රකාශනයෙන් පැහැදිලි කරයි. මෙහි සඳහන් පොදු යහපත යනු,
(1) එකිනෙකාගේ ශුභසිද්ධිය සඳහා වැඩ කිරීමයි.
(2) සංවර්ධනයේ වැදගත්කම වෙනුවෙන් ඇප කැප වී වැඩ කිරීමයි.
(3) මනුෂ්‍යයා ස්වාභාවයෙන්ම සමාජීය වන නිසා අනුන් සමග එකතු වී වැඩ කිරීමයි.
(4) සෑම ජන කොටසකගේම හා පුද්ගලයන්ගේ පූර්ණත්වයට ඉඩ සැලසීමයි.
(5) සහෝදරයාට ප්‍රේම කරමින් සමාජයෙන් කොන්වූවන් සමග එකතුව වැඩ කිරීමයි.

**49.** "සාමය යනු මානව පැවැත්ම තුළ පවතින නිසල බව හා සාධාරණත්වය ක්‍රියාත්මක වීම හා දයා කරුණාවේ ප්‍රතිඵලයකි" යනුවෙන් සඳහන් වන්නේ,
(1) වර්තමාන ලෝකයේ ශුද්ධ වූ සභාව නම් ලේඛනයේ ය.
(2) ලෝක සාමය නම් විශ්ව ලේඛනයේ ය.
(3) කතෝලික සභා ධර්මෝපදේශය නමැති ග්‍රන්ථයේ ය.
(4) වෙහෙසෙන මිනිස්සු නම් විශ්ව ලේඛනයේ ය.
(5) මව සහ ගුරුවරිය නම් විශ්ව ලේඛනයේ ය.

**50.** ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය යටතේ දැනට ලියාපදිංචි වී ඇති කිතුනු සභා ගණන කීය ද?
(1) දෙකයි
(2) තුනයි
(3) පහයි
(4) හතයි
(5) අටයි

* * *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
**අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2019**

**නව නිර්දේශය/ புதிய பாடத்திட்டம்**

| විෂයය අංකය<br>பாட இலக்கம் | 43 | විෂයය<br>பாடம் | ක්‍රිස්තියානි ධර්මය |
|---|---|---|---|

**ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்**
**I පත්‍රය/பத்திரம் I**

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 2 | 21. | 2 | 31. | 1 | 41. | 3 |
| 02. | 1 | 12. | 3 | 22. | 3 | 32. | 2 | 42. | 3 |
| 03. | 2 | 13. | 4 | 23. | 1 | 33. | 3 | 43. | 3 |
| 04. | 4 | 14. | 4 | 24. | 4 | 34. | 2/5 | 44. | 2 |
| 05. | 4 | 15. | 1 | 25. | 5 | 35. | 2 | 45. | 2 |
| 06. | 3 | 16. | 1 | 26. | 4 | 36. | 5 | 46. | 5 |
| 07. | 2 | 17. | 3 | 27. | 2 | 37. | 4 | 47. | 3 |
| 08. | 3 | 18. | 4 | 28. | 3 | 38. | 1 | 48. | 4 |
| 09. | 5 | 19. | 2 | 29. | 5 | 39. | 1 | 49. | 3 |
| 10. | 2 | 20. | 5 | 30. | 1 | 40. | 5 | 50. | 5 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்
මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 50 = 100

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2019 (නව නිර්දේශය)

## ලකුණු දීමේ පටිපාටිය

## II පත්‍රය

**1.** (i) දේවානුභාවයෙන් ලේඛනගත කරන ලද ශුද්ධ ලියවිල්ලේ අරමුණු **දෙකක්** (2 තිමති 3:16 ට අනුව) ලියන්න. (ලකුණු 02යි)

(ii) ස්වභාව ධර්මයේ නීතිය ඉක්මවා විශේෂ ආකාරයෙන් හා අද්විතීය ආකාරයෙන් සිදු වූ දේව අනාවරණයෙහි අංශ **දෙක** ලියන්න. (ලකුණු 04යි)

(iii) දේවානුභාවයේ ප්‍රභේද **තුන** නම් කරන්න. (ලකුණු 06යි)

(iv) තෝරාගත් ජනතාවට දෙවියන් වහන්සේ අනාවරණයවීම තුළ ඔබට ලැබෙන අත්දැකීමෙන් ඔබ විසින් සමාජයට කරන සේවා **හතරක්** පහදන්න. (ලකුණු 08යි)

01.

I
- ඉගැන්වීමට
- දුරුමත දුරු කිරිමට
- හික්මවීමට
- ධර්මිෂ්ඨ ජිවිතයක් ගත කිරිමට උපදෙස් දිමට

(කරුණු දෙකකට **ලකුණු 02)**

II
- ස්ව අනාවරණය - තමන් වහන්සේ පිළිබඳ අනාවරණය
- උන්වහන්සේගේ ගැලවීමේ සැලැස්ම පිළිබඳ අනාවරණය

**(කරුණු දෙකකට ලකුණු 04 යි)**

III
- එඩේරික දේවානුභාවය
- දෙසීම සඳහා වූ දේවානුභාවය
- ලිවීම සඳහා අණ ලැබිම

**(කරුණු තුනකට ලකුණු 06 යි)**

IV
- දෙවියන් වහන්සේ තෝරාගත් ජනතාව වන ඉශ්රායෙල් ජනතාව සෑම අවස්ථාවකදීම ආරක්ෂාව හා මගපෙන්වීම පෙන්වූවා සේ (රාත්‍රි කාලයේ දී ගිනි ටැඹ දහවල් කාලයේ දී වළාකුළ) සමාජයේ නොමගයන පුද්ගලයන්ට අවශ්‍ය මග පෙන්වීම හා ආරක්ෂාව සැලසීම, දිව්‍ය සංරක්ෂණය තුළ ඔවුන් පෝෂණය කිරිම

- සමාජයේ වහලුන් වශයෙන් සිටි ඉශ්රායල් ජනතාව දෙවියන් වහන්සේ ගලවා ගත්තාක් මෙන් අප සමාජය තුළ නොයෙකුත් ශාරීරික හා මානසික වශයෙන් පීඩා විඳින අසරණ අයට පිහිට උපකාර කිරිම, ඔවුන්ගේ ප්‍රශ්ණවලට ඇහුම්කන් දිම

- ඉශ්රායල් ජනතාව නොයෙක් අවස්ථාවලදී දෙවියන්ට මැසිවිලි කීවත් (උදා: ජලය හා ආහාර නොමැති වූ විට) දෙවියන් වහන්සේගේ කරුණාව ඔවුන්ට නොඅඩුව ලැබුනි. ඒවාගේ සමාජයෙන් කුමණ ප්‍රශ්න පැණ නැගුනත් අන්අය වෙනුවෙන් ඉදිරිපත් වී ඔවුන්ගේ අවශ්‍යතා සපුරාදිමට කටයුතු කිරිම

- මෝසෙස් තුමා සේවකත්වයේ ලක්ෂණ පෙන්වූවා සේ අප ද සෑම කාර්යයක දීම අන්අයට සේවය කිරීමට ඉදිරිපත් විය යුතුය.

**(මෙවැනි කරුණු හතරක් සඳහා ලකුණු 08 යි)**

**2.** (i) දෙවියන් වහන්සේ විසින් මවන ලද මිනිසාගේ ආහාර සඳහා **නො වන** අති විශේෂ ශාක දෙවර්ගය නම් කරන්න. (ලකුණු 02යි)

(ii) යාවේ හා පූජක සම්ප්‍රදායවල කතුවරුන් සඳහන් කරන ආබ්‍රහම් සමග දෙවියන් වහන්සේ කළ ගිවිසුමේ වැදගත් කරුණු **දෙක** ලියන්න. (ලකුණු 04යි)

(iii) මිනිසා පාපයට වැටීම කරණකොටගෙන බිඳ වැටුණු සබඳතා **තුනක්** ලියන්න. (ලකුණු 06යි)

(iv) "ඉශ්රායෙල් ජනයා සීනයි ගිවිසුම මගින් ලද කැඳවීම නූතන කිතුනුවාට ප්‍රසාද ස්නාපනය මගින් හිමි වේ." එම කැඳවීම තුළ සමාජයට ඔබ කරන්නා වූ දූත සේවා **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 08යි)

02.

I
- ජීවන වෘක්ෂය
- හොඳ නරක අවබෝධ කර ගැනීමේ වෘක්ෂය

**(කරුණු දෙකකට ලකුණු 02 යි)**

II
- අසංඛ්‍ය වූ දරු පරපුරක් (උත් 15:5, 17:5)
- ඔවුන් ට සදහටම හිමි වන දේශයක් (උත් 15:21, 17:8)

**(කරුණු දෙකකට ලකුණු 04 යි)**

III
- දෙවියන් වහන්සේ හා මනුෂ්‍යා අතරත්
- මිනිසා හා ස්ත්‍රිය අතරත් (ඉෂ් හා ඉෂ්ෂහ්)
- මිනිසා හා ස්වභාව ධර්මය අතරත් (ආදම් හා අදමහ්)

පැවැති සබඳවා බිඳවැටුනි

**(කරුණු තුනකට ලකුණු 06 යි)**

IV
- ප්‍රසාද ස්නාපනය මගින් එඬේරික (රාජකීය) පූජක, දිවැසි යන ත්‍රිවිධ වූ කාර්යයන් හිමි වේ. ජාති ආගම් කුල භේද නොතකා සියලු දෙනාටම එක හා සමානව දෙවිදුන්ගේ දරුවන් සේ සලකා අවශ්‍යතා ඉල්ලීමට පෙර අවශ්‍ය දේ ඉටු කිරීම
- මිසමේ දහම් පාසලට හා අනෙකුත් සමිති සමාගම් වලට බැඳි තමන්ගේ කාලය හා ශ්‍රමය කැපකරමින්, වැය කරමින් ගිහි අපෝස්තලික සේවාවල යෙදීම
- සමාජයේ අසරණ වී සිටින අය වෙනුවෙන් දෙවිදුන් ඉදිරියේ මැදිහත් කරුවෙකු වෙමින් ඔවුන්ට සේවය කිරීම හා ඔවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම (පොදු පූජකවරය තුළ)
- කාලයේ සලකුණු තේරුම් ගනිමින් අපට පැවරෙන වගකීම් හා යුතුකම් සමාජය තුල නොපිරිහෙලා ඉටු කිරීම
- දේව වචනයට පිටුපා කටයුතු කරන අයට දේව වචනය අනුව ජීවත් විය යුතු ආකාරය පහදා දීම
- අභියෝග හමුවේ නොසැලි දේව විශ්වාසයෙන් තම කාර්යයන් නොපිරිහෙලා ඉටු කිරීම

**(මෙවැනි කරුණු හතරක් සඳහා ලකුණු 08 යි)**

**3.** (i) ධර්මය ප්‍රචාරය කිරීම සඳහා පෘතුගීසි ධර්මදූතවරුන් අනුගමනය කළ ධර්ම ප්‍රචාර ක්‍රම **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ii) බ්‍රිතාන්‍ය යුගයේ ලංකාවේ අධ්‍යාපනය වෙනුවෙන් බිහි කළ මධ්‍යම පාසල් කොමිසම මගින් ඉටු වූ සේවා **දෙකක්** ලියන්න. (ලකුණු 04යි)

(iii) ලන්දේසි යුගයේ ලංකාවේ අධ්‍යාපනය සාර්ථක වීමට බලපෑ කරුණු **තුනක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 06යි)

(iv) ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමාගේ ධර්මදූත ප්‍රතිපත්ති මගින් අද සමාජයේ ගිහි නායකයන්ට ගත හැකි ආදර්ශ **හතරක්** විස්තර කරන්න. (ලකුණු 08යි)

I

- දේශීය භාෂා ඉගෙන ගෙන එම භාෂාවලින්ම ධර්මය ප්‍රචාරය කිරිම
- ආගමික පතපොත දේශීය භාෂාවන්ගෙන් ලිවීම
- කුඩා දරුවන්ට දහම ඉගැන්වීමට ප්‍රාථමික පාසල් ඇරඹීම
- විවිධ දයා සේවාවන් හි නිරත වීම
- නාට්‍ය, පෙරහැර යාම. සුරුවම් භාවිතය වැනි ක්‍රම මගින් ආගමික ප්‍රබෝධයක් ඇති කිරිම

**(කරුණු දෙකකට ලකුණු 02 යි)**

II

- කොළඹ ඇකඩමිය සමෘද්ධිමත් කිරීම
- ගුරු පුහුණුව සඳහා " නෝමල් පාසල් " ආරම්භ කිරිම
- අධ්‍යාපනයට ප්‍රායෝගික නැඹුරුවක් ලබා දීම සඳහා මධ්‍යම පාසල් තුනක් ආරම්භ කිරිම (ගාල්ල, මහනුවර, කොළඹ)
- මහනුවර සහ කොළඹ උසස් බාලිකා පාසල් ආරම්භ කිරීම

**(කරුණු දෙකකට ලකුණු 04 යි)**

III

- ක්‍රමානුකුල හා සංවිධානාත්මක බවකින් යුතු අධ්‍යාපනයක් මෙරට ක්‍රියාත්මක කිරිම
- සැම දේවස්ථානයක් අසලම පාසලක් පිහිටු වීම
- අධ්‍යාපනය අනිවාර්ය වූ අතර, සියලුම ළමයින් පාසල්වලට යැවිම අනිවාර්ය විම
- පාසල් නොයවන දෙමාපියන්ට දඩ ගැසීම
- අධ්‍යාපනය පිළිබද සෘජු වගකීම ලන්දේසී රජය විසින් භාර ගැනීම
- වයස අවුරුදු 15 තෙක් අධ්‍යාපනය අනිවාර්ය වූ අතර, පාසලෙන් විභාගයක් පවත්වා " ලාගිර්ඩන් " නැමති සහතිකය ලබා දිම
- දක්ෂ ළමයින්ට උසස් අධ්‍යාපනයට, ගුරු පුහුණුවට හා උසස් අධ්‍යානය සඳහා විදේශ ගතවීමට ඉඩ සැලසීම
- සකෝලාකල් කොමිසම නැමති විශේෂ ආයතනයක් මගින් පාසල් වලට ගුරුවරුන් පත් කිරිම, පාලනය කිරිම, පරීක්‍ෂකවරුන් මගින් පාසල් නිරීක්ෂණය

**(කරුණු තුනකට ලකුණු 06 යි)**

IV

- ජුසේවාස් මුනිතුමා දේශපාලන සම්බන්ධයක් හෝ රාජ්‍ය අනුග්‍රහයක් හෝ නොමැතිව ධර්මදූත ප්‍රචාරය සාර්ථකව ඉටු කලාක් මෙන් ගිහි නායකයන් තමන්ට ලැබෙන පෞද්ගලික වාසි නොතකා කාලය හා ශ්‍රමය ධර්මප්‍රචාර කටයුතු සඳහා යෙදවීම

- යාච්ඤාවේ ජිවිතය තම ජිවිතයට ආභරණයක් කොට ගෙන සියල්ල දෙවිදුන් තුළ සිදුකලාක් මෙන් සෑම කටයුත්තක දිම දෙවියන් වහන්සේගේ මැදිහත්කම පතමින් නිරතුරු යාච්ඤාවේ නිතර විම

- ධර්මදූත කාර්යයන් සදහා ගිහි නායකත්වය යොදා ගත්තාක් මෙන් සියලුම ජනකොටස් සමග සහයෝගයෙන් හා එකමුතුව කටයුතු කිරිම

- ජුසේවාස් මුනිතුමා සේවකත්වයේ ගති ලක්ෂණ තම ධර්මදූත ප්‍රතිපත්ති දියත් කිරීමේ දී කලාක් මෙන් අපද සේවකත්වයේ ගති ලක්ෂණ තම කාර්යයන් ඉටු කිරීමේ දී පිළිඹිබු කළ යුතු වේ.

- දිව්‍ය පූජාව ලතින් භාෂායෙන් සිදු වුවද යාච්ඤා දේශීය භාෂාවෙන් කිරිමට මග පෙන් වූ වා සේ ගිහි නායකයින් ද සමාජය තුළ ධර්ම ප්‍රචාර කටයුතු වලදී තේරුම් ගත හැකි පරිදි සරලව දහම් කටයුතු ඉදිරිපත් කිරීම.

**(මෙවැනි කරුණු හතරක් සදහා ලකුණු 08 යි)**

04. **අභිමතාර්ථය :- ශුද්ධ බයිබලයේ උත්තරීතර බව නිවැරදිව හඳුනාගෙන එදිනෙදා ජීවිතයේදි අත්දකියි.**

(i) ශුද්ධ බයිබලයේ කතෘත්වය පිළිබඳ ව කරුණු **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

I සභා පියවරුන්ගේ කාලයේ සිටම පිළිගැනීම වී ඇත්තේ
- ශුද්ධ ලියවිල්ල දේවානු භාවයෙන් ලියවුනු බවත්
- එහි කතෘ දෙවියන් වහන්සේ බවත්ය.

II අති උතුම් දහතුන්වන ලියෝ පාප් තුමාගේ දිව්‍ය සංරක්ෂණය නම් විශ්ව ලේඛණයට අනුව
- ශුද්ධ බයිබලයේ ප්‍රධාන කර්තෘ දෙවියන් වහන්සේ බවත්,
- උපකර්තෘ මිනිසා බවත්ය.

III දෙවියන් වහන්සේ ශුද්ධ බයිබලයේ ප්‍රධාන කර්තෘ නිසා එහි ඇත්තේ දෙවියන් වහන්සේගේ අනාවරණයි.

IV අනාවරණ/පණිවිඩය සර්ව කාලීනය. සර්ව භෞමිකය.
- ඒ නිසා ශුද්ධ බයිබලයේ පණිවිඩයට ස්ථාවර බවත් හා සදාතනික බවක් ඇත.

V මිනිසා නිර්මාණාත්මක ක්‍රියාවලිය මගින් ශුද්ධ බයිබලයේ උපකර්තෘ නිසා ශුද්ධ බයිබලය තුල ඇති කරුණු ඓයිතිහාසික හා විද්‍යානුකුල නොවන සිද්ධීන් තුළ, සිමිත පැත්තක් ඇත.
- එම නිසා මිනිසා සීමා සහිත පුද්ගලයකු වේ.

VI මිනිසා දේව හස්තයේ උපකරණයක් නිසා දෙවියන් වහන්සේගෙන් ලත් දේව පණිවිඩය ශුද්ධ බයිබලයේ ඇත. මිනිසා සතු බුද්ධය හා නිදහස් තැමැත්ත මෙහෙයවා නිර්මාණාත්මක ක්‍රියාවලියේ උපකර්තෘ වන මිනිසා යෙදී ඇත.

(මෙවැනි කරුණු පහක් සදහා ලකුණු2x5=10 )

(ii) යොවුන් වියේ ඔබට පැමිණෙන අභියෝග හමුවේ ශුද්ධ බයිබලය තුළින් විසඳුම් ලබාදෙන අවස්ථා **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

I නායකත්වයක් ලැබුණු විට එය බාර ගැනිමට අපොහොසත් වීම

II තමාගෙන් සමාජයට පවුලේ සාමාජිකයින්ට විය යුතු යුතුකම් අවබෝධ කර ගැනීමට නොහැකි වූ විට

III පැමිණෙන විලාසිතාවන්ට වහල්ව කටයුතු කිරිම හා ඒවා ලබා ගැනීමට තැත් කිරිම

IV යහපත් පුරවැසියෙක් ලෙස කටයුතු කරන්නේ කෙසේද යන්න, ගැටලු ඇතිවූ විට

V අපට වැළදෙන ලෙඩරෝග අභියස

VI අපට අවශ්‍ය නොයෙකුත් අවශ්‍යතා අභියස

**විසඳුම් ලබා දෙන අවස්ථා**

I දිවැසියවර කැදවීම් පිළිබදව අධ්‍යයනය කිරිම මගින්

II පාවුළුතුමාගේ ලිපිවල සඳහන් දරුවන් සතු යුතුකම් හා වගකීම් පිළිබදව අධ්‍යයනය කිරිම මගින්

III (මතෙව් 6:28) හි සඳහන් "ඔබ ඇදුම් ගැන කරදර වන්නේ කුමටද කෙතේ මානෙල් වැඩෙන හැටි කල්පනා කරන්න. ........." ආදර්ශයට ගැනීම

IV භාග්‍ය අට හා දේව පණත් අනුව ජීවත් වීම

V ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට සම්බන්ධවිමට හැකියාව ලබා ඇති බව

VI ඉශ්රායෙල් ජනතාව පාළුකරයේ අත්දුටු දිව්‍ය සංරක්‍ෂණය ලෙසින්

**(මෙවැනි අභියෝග පහක් හා ඊට අදාල විසඳුම් ශුද්ධ බයිබලය තුළින් ගෙන ලියා ඇත්නම් ලකුණු 10 යි)**

**අභිමතාර්ථය - ඉශ්රායෙල් ගමන තුළ ලැබූ දිව්‍ය සංරක්ෂණය කිතුනු දිවිය තුලදී අත්දකියි.**

**5.** (i) කාන්තාර ගමනේ දී ඉශ්රායෙල් ජනතාව දිව්‍ය සංරක්ෂණය අත්දුටු අවස්ථා **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

I කාන්තාර ගමනේදී ඉශ්රායෙල් ජනතාව දිව්‍ය සංරක්ෂණය අත්දුටු අවස්ථා පහක් විස්තර කරන්න.

- වළා ටැඹ හා ගිනි ටැඹ
  ඉශ්රායෙල් ජනයා සමග දෙවියන් වහන්සේ වැඩසිටීමේ සළකුණක් ලෙස දිවා කාලයට වළා ටැඹක් ද, රාත්‍රී කාලයට ගිනි ටැඹක් ලෙස ද වැඩ සිටි සේක.

- මාරා නැමැති ස්ථානයේ පිපාස වීම
  දින තුනක් යන තුරු පිපාසව සිටි ජනයාට කරදිය ජලය මිරිදිය ජලය බවට පත්කර බීමට දුන් සේක.

- මස්සා හා මෙරිබා යන ස්ථානවලදී ජලය ලැබීම
  රෙපිඩිම් නම් ස්ථානයේ ජලය නොතිබුණු අතර මෝසෙස්තුමා දේව නියමය මත පර්වතයට තට්ටු කළ විට ජලය ලැබීම

- පාළුකරයේදී (සීන් කාන්තාරයේදී) ආහාර සැපයීම
  ආහාර හිඟවීම හේතුවෙන් ඊශ්‍රායෙල් ජනතාව මැසිවිලි නැගූ විට ඔවුනට ආහාර ලෙස මන්නා හා වටුවන් ලබා දුන් සේක.

- ලෝකඩ සර්පයා
  විසකුරු සර්පයන් දෂ්ඨ කිරීමෙන් ඉශ්රායෙල් සෙනඟ බොහෝ සෙයින් මරණයට පත් වන්නට වූ විට සමිඳානන් වහන්සේ කී පරිදි මෝසෙස් තුමා ලෝකඩ සර්පයෙකු තනා රිටක ගසා පෙන්වූ අතර එදෙස බැලූ ඔවුන් සුවපත් විය.

- ආක්‍රමණ වලින් ආරක්ෂා වීම.
  ඉශ්රායෙල් ජනයා අමෙලෙක්වරුන්ගේ ආක්‍රමණයට ගොදුරු වූ අතර යාච්ඤා කිරීම හේතු කොට ගෙන ඇමෙලෙක්වරු පරාජය විය. ඉශ්රායෙල්වරුන්ට ජය අත් විය.

- රතු මුහුද තරණය කිරීම
  මිසර හමුදාව ලුහු බඳිමින් එන විට මුහුද දෙබෑ වී ඉශ්රායෙල් ජනතාවට එතෙර වීමට මඟ පාදා දුන් සේක.

**(මෙවැනි කරුණු 05 ක් ලියා ඊට අදාළව පැහැදිලි කර ඇත්නම් ලකුණු 2x5=10 යි)**

(ii) කිතුනුවකු වූ ඔබ එදිනෙදා ජීවිතය තුළින් දිව්‍ය සංරක්ෂණය අත්දකින අවස්ථා **පහක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

1. ජීවිත ගමන තුල එදිනෙදා මුහුණ දීමට සිදුවන දුක් කරදරවලදී.
2. අපට පැමිණෙන ජීවිත අභියෝග වලදී.
3. හදිසියේ යම් යම් තීරණ ගැනීම් වලදී.
4. ජීවන ගමනේ තනිවීම්, අසරණ වීම් තුලදී.
5. හදිසි වෙන් වීමකදී.

(**මෙවැනි කරුණු** 05ක් **ලියා ඊට අදාලව පැහැදිලි කර ඇත්නම් ලකුණු 2x5=10** යි)

**අභිමතාර්ථය :- කිතුනු ඉගැන්වීම් වලින් පරිපූර්ණ වී ස්වර්ග රාජ්‍යයේ පංගුකාරත්වය ලබයි.**

**6.** (i) කන්ද උඩ දේශනය මගින් ඉදිරිපත් කරන පරමාර්ථ **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

I

- ශ්‍රාවකයන්ගේ ධර්මිෂ්ඨකම විනය ධරයන්ගේ හා පරිසිවරුන්ගේ ධර්මිෂ්ඨකම අභිබවා යා යුතු බව.
- ක්‍රිස්තුන් වහන්සේ නව මෝසෙස් ලෙස නව කන්දක් මත නව ව්‍යවස්ථාවක් දානය කරන බව
- පැරණි ව්‍යවස්ථාව සම්පූර්ණ කර නව ව්‍යවස්ථාවක් (ප්‍රේමයේ ව්‍යවස්ථාවක්) දානය කරන බව
- දේව රාජ්‍යයට ඇතුළුවීමට කැමති අය පොළොවේ ලවණ මෙන් ද ලෝකයේ ආලෝකය මෙන් ද ක්‍රියාකළ යුතු බව.
- මිනිස් සිත් තුළ ඇති අවම ගති ඉවත් කර ඇතුළාන්ත පිරිසිදු බවකින් ජීවත් විය යුතු බව.

**(මෙවැනි කරුණු 05 කට ලකුණු 2x5=10 යි)**

(ii) ධර්මදූත සේවය සඳහා සූදානම් වන්නන් තුළ තිබිය යුතු ගුණාංග **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

II

- දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන්, වැඩිපුර යමක් නොගෙන සැහැල්ලුවෙන් ගමන් කළ යුතුය. මන්ද ඔවුන් දිව්‍ය සංරක්ෂණය තුල යැපිය යුතුය.
- අල්පේච්ඡ ජීවිතයක්, සරල ජීවිත පැවැත්මත් අත්‍යවශ්‍යය.
- සාමයේ පිණිවිඩකරුවන් මෙන් නිතරම අනුන් වෙනුවෙන් පරිත්‍යාග විමට හා කාලය, ශ්‍රමය වැය කිරීමට පුරුදු පුහුණු විය යුතුය.
- තමන්ට එල්ලවිය හැකි දුෂ්කරතා හා සිත් රිදීම් වලදී අධෛර්යට පත් නොවී තම කාර්යය නොපසු බට විර්යයෙන් කිරීමට උත්සහ කළ යුතුය.
- සැම පුද්ගලයෙක්ම දේව දරුවෙක් සේ සලකා සැමටම එක සේ සැලකිය යුතුය. ගරුකළ යුතුය.
- නිතරම දෙවිඳුන් සමග සිටිමින් ශුද්ධ ලියවිල්ල තම ජීවිතයේ කොටසක් කරගත යුතුය.

**(මෙවැනි කරුණු 05 ට ලකුණු යි)**

**අභිමතාර්ථය :- ජීවිත අභියෝග හමුවේ ශුද්ධාත්ම බලයෙන් පිරිපුන් වී විශ්වාසයට සාක්ෂි දැරූ ආකාරය පිළිබඳව සිසු ආකල්ප පරීක්ෂා කිරීම**

**7.** (i) මිලාන් ආඥාවෙන් පසු ලැබුණු වරප්‍රසාද **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

I

- කිතුනුවන්ගේ සබත ලෙස හඳුන්වන ඉරුදින නිවාඩු දිනයක් බවට පත් කරන ලදි.
- කුමන අපරාධයකට අසුවුවද කුරුසපත් කිරීම අවලංගු කෙරිනි.

- රෝම ඇදහිලිවල තිබූ දූෂිත චාරිත්‍ර වාරිත්‍ර අවලංගු කෙරිනි.
- කිතුනු පූජකවරුන් අයබදුවලින් නිදහස් කෙරිනි.
- රාජ්‍යයේ පරිපාලන තනතුරු දැරීමට කිතුණුවන්ට අවස්ථාව දෙන ලදි.
- කුරුසියේ ලකුණු රාජ්‍යයේ නිල ලාංඡනය බවට පත්විය.
- ලැටරන් මාලිගය ශුද්ධෝත්තම පියතුමන්ට ප්‍රධානය කෙරිණි.
- කිතුණුවන්ගෙන් පැහැරගත් සියලු ඉඩකඩම් දේපළ නැවත ඔවුනට ලබා දෙන ලදි.
- කිතුනුවන්ට විරුද්ධව පනවා තිබූ සියලු නීති අහෝසි කෙරිණි

**(මෙවැනි අදහස් 05 ක් විස්තර කර ඇත්නම් ලකුණු 2x5=10 යි )**

(ii) පීඩන සමය තුළ කිතුනුවන් අතර දිස් වූ විශේෂ ලක්ෂණ **පහක්** සඳහන් කර, අද සමාජයෙන් ඔබට එල්ලවන අභියෝගවලට මුහුණ දෙන ආකාරය එම කරුණු පදනම් කොටගෙන පහදන්න. (ලකුණු 10යි)

II
- පැමිණි සෑම අභියෝගයකටම නිර්භීතව මුහුණ දීම
- විශ්වාසය සුරැකීම සඳහා දැරූ ප්‍රයත්නය
- අභියෝග හමුවේ විශ්වාසය සවිමත් කිරීම
- පීඩන හමුවේ ශුද්ධාත්ම බලය අත්දැකීම
- නිරතුරුවම විශ්වාසයට සාක්ෂි දැරීම
- පීඩා මාධ්‍යයේ විශ්වාසය හා කිතු දහම වර්ධනය වීම

**අභියෝගවලට නිර්භීතව මුහුණ දීම**

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම.

- මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි නොවී පුනරුත්තාපන කටයුතුවලට සහභාගී වී සමාජයට හොඳ පුරවැසියකු වීම

**විශ්වාසය සුරැකීම සඳහා ප්‍රයත්නය දැරීම**

දෙමාපියන්ගේ හා දෙවිදුන්ගේ ආදරයෙන් සෙනෙහසින් මිදී වෙනත් පුද්ගලයින් පිටුපස හඹාගෙන යාම. (මූල ධර්මවාදීන්ගේ බොරු ඉගැන්වීම් පසුපස ගොස් තම විශ්වාසය පාවා දීම)

දෙමාපියන්ගේ හා දෙවිදුන්ගේ සෙනෙහසට මුල් තැන දීම දෙවිදුන්ගේ හා දෙමාපියන්ගේ විශ්වාසය තහවුරුවන පිණිස නිරතුරුවම කටයුතු කිරීම.

- නැකත් බැලීම, අංජනම් එළි, සාස්තර බැලීම, වේලාව බලා වැඩ කිරීම වැනි දෑ අප විශ්වාසයට එරෙහිව යෑමක් බව අවබෝධ කර ගැනීම

**අභියෝග හමුවේ විශ්වාසය සවිමත් කිරීම**

ලෞකිකත්වයට මුල්තැන දීම

- ලෞකිකත්වයට නැඹුරු නොවී අධ්‍යාත්මිකත්වයට මුල් තැන දී කටයුතු කිරීම

**පීඩන හමුවේ ශුද්ධාත්ම බලය අත්විඳීම**

අසාධාරණත්වය තුළ කටයුතු කිරීම

- අයුක්තියට අසාධාරණයට එරෙහිව සෑම මොහොතක දීම සෑම ස්ථානයකදීම ශුද්ධාත්ම බලය තුළින් සාක්ෂි දැරීම. (දේව වටිනාකම් දේව රාජ්‍යයේ වටිනාකම් වලට සාක්ෂි දැරීම. ඉවසීමෙන් හා ප්‍රඥාව ඇතුව ඇතුලුව ක්‍රියා කිරීම)

**නිරතුරුවම විශ්වාසයට සාක්ෂි දැරීම**

නවීන තාක්ෂණික උපකරණවලට වහල් වී නොමග යාම

- අන්තර්ජාලය, දුරකථනය යහපත් දේ සඳහා හැසිර වීම සහ එම නවීන උපකරණ වලට අබ්බැහි නොවී දේව විශ්වාසය වර්ධනය කර ගැනීමට නවීන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

(මෙවැනි කරුණු පහක් විස්තර කර ලියා ඇත්නම් ලකුණු 2x5=10 යි )

**අභිමතාර්ථය :- ශුද්ධ වූ සභාව කාලානුරූපී කර ගැනීමට නිසි මග ගැන්වීම සඳහා සභාව දැක්වූ දායකත්වය පිළිබඳ සිසු අවබෝධය පරීක්ෂා කිරීම**

**8.** (i) දහසය වන සියවසේ ශුද්ධ වූ සභාවේ ප්‍රතිසංස්කරණ කාර්යය ඉදිරියට ම ගෙන යාමට නායකත්වය ගත් පූජක, පැවිදි නිකාය **පහක්** නම් කර ඒවා පිළිබඳ ව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) ප්‍රතිසංස්කරණවාදී සභාවල ඉගැන්වීම්වලට පිළිතුරු දීම සඳහා ආරම්භ කරන ලද ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව (1545–1563) විසින් ඉදිරිපත් කරන ලද නවෝදයේ ව්‍යාපෘති **පහක්** සඳහන් කර, ඒවා ඔබගේ ආධ්‍යාත්මික වර්ධනයට රුකුලක් වන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10යි)

- කාර්මේල් නිකාය
- කැපුචින් නිකාය
- වින්සෙන්කියානු නිකාය
- ජේසු නිකාය
- දයාවේ සෙහොයුරින්ගේ නිකාය
- දලාසල් නිකාය

**(නිකායන් 5 ක් නම් කිරීමට ලකුණු 05)**

**කාර්මේල් නිකාය**

- පලස්තීනයේ කාර්මෙල් කන්දෙහි 12 වන සියවසෙහි ආරම්භ වී ඇත.
- මෙම නිකායට අයත් තාපසයන් කාර්මේල් කන්දෙහි හුදකලාව ජිවත් වූ අතර දැඩි තාපස ජීවිතයක් ගත කළහ
- ශු. සයිමන් ස්ටොක් මෙම පැවැදි ජීවිත ක්‍රමය එංගලන්තයට හඳුන්වා දුන්නේය.

- විශ්ව විද්‍යාලය ආශ්‍රිත නගරවල කාර්මෙල් නිකායේ තාපසාරාම බිහි කිරීමට කටයුතු කළේ තාපසවරුන් විශ්ව විද්‍යාලවල දේශනා කරමින් ධර්මදූත සේවයේ යෙදුණු බැවිනි.
- කාර්මේල් නිකායේ පැවිදිවරිය වූ අවිලාහි තෙරේසා තුමිය (1515-1582) තම පැවිදි නිකාය තුළ නවෝදයක් ඇති කිරීමට උත්සහ කළාය
- කාර්මේල් නිකායේ තිබූ තාපස දිවියේ භාවනා යෝගී ජීවිතය නැවත ඇති කරලීමට අවිලාහි තෙරේසා තුමියගේ උත්සාහය නිසා හැකිවිය. ඇයට කුරුසියේ ජුවාම් තුමාගේ සහයෝගය ලැබිණි.
- " පූර්ණ දිවියකට මග" (The way of Perfection) 'ඇතුළාන්ත මන්දිරය" (The Interior Castle) අවිලාහි තෙරේසාතුමිය විසින් රචිත විශිෂ්ඨ අධ්‍යාත්මික කෘති වේ.
- අවිලාහි තෙරේසා තුමියගේ යොමු කිරීම හා මගපෙන්වීම මගින් කුරුසියේ ජුවාම් තුමා (1542-1591) පුනරුදයට දායක විය. මෙතුමා විසින් අධ්‍යාත්මික ජීවිතය පිළිබඳ පහත ග්‍රන්ථ ලියනු ලැබ ඇත.

**කාර්මේල් පරිවර්තය නැගීම** - The Ascent of Mount Carmel
**ආත්මයේ අඳුරු රාත්‍රිය** - Dark Night of the Soul
**අධ්‍යාත්මික ගීතය** - The Spiritual Canticle
**ප්‍රේමයේ ජීවන දැල්ල** - The Living Flam of Love

- මොවුන් දෙදෙනා විසින් රචිත අධ්‍යාත්මික කෘති බොහෝ දෙනාගේ ජීවිතවලට ඉමහත් සහනයක් විය.
- අධ්‍යාත්මික ජීවිතයේ දේව සබඳතාව අත්දැකීමට බැගෑපත්කම නැතිවම බැරිය. යන සංදේශය අනුව කාර්මේල් නිකායික ජේසුගේ කුඩාමල වන තෙරේසා තුමිය ජීවිතයෙන් සාක්ෂි දරා ඇත.

**කැපුචින් නිකාය**

- 16 වන සියවසේ ඉතාලියේ බිහි වූ පැවිදි නිකායයන් අතරින් කැපුචින් නිකාය ප්‍රධාන වේ. මෙය 13 වන සියවසේ ආරම්භ වූ ෆ්‍රැන්සිස්කානු නිකායයෙන් බිහි වූවකි.
- අසිසියේ ශුද්ධ වූ ෆ්‍රැන්සිස් තුමා නීතිය ඉතා සූක්ෂම ලෙස පිළිපැදිය යුතු යැයි කළ ප්‍රකාශය හා ශුද්ධ ලියවිලි අනුව ජීවිත ක්‍රමය නැවත ඇති කරලීමේ අදහසින් කැපුචින් නිකාය බිහි කරන ලදි.
- මොවුනට නායකත්වය ලබාදෙමින් ෆ්‍රැන්සිස්කානු නිකායේ මතේඕ ද බස්සිකෝගේ දායකත්වය තුළ බිහිවූවකි.
- නිකාය ආරම්භයේ දී ඉමහත් බාධක ශූ. සභාවෙන් ම මතු වුව ද මෙම නවෝදය සෙමෙන් සෙමෙන් ඉදිරියට ඇදිණි. මොවුහු තම ධර්මෝපදේශ සේවයත්, ආශ්‍රමික ජීවිකයත් එකට එක් කර දිවි ගෙවූහ, ලෙඩුනට උපස්ථාන කරමින් හා ඉතා දුෂ්කර ලෙස වැඩ කිරීමෙන් ලබා ගත් ආදායමෙන් ජීවත් වූහ, ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණවාදීන්ට විරුද්ධ ව දේශනා කළහ, දිළිඳු ජීවිතයක් ගත කළහ.

**වින්සෙන්තියාන නිකාය**

- ශුද්ධ වූ වින්සෙන්ති ද පාවුලු තුමා සහා ප්‍රතිසංස්කරණය සඳහා පූරෝගාමී ව කටයුතු කළ කෙනෙකි.
- මෙතුමා දිළිඳුන් ද කෙරෙහි ගැඹුරු ආදරයක් හා කරුණාවක් දැක්වූ කෙනෙකි.
- ක්‍රි.ව. 1625 වින්සන්ට් ද පාවුලු තුමා විසින් වින්සෙන්තියානු නිකාය ප්‍රංශයේ ආරම්භ කෙළේය. මෙහි අරමුණු වූයේ දුගීන්ට ධර්ම දානය හා පූජක පුහුණුවය.
- කතෝලික ධර්මය දේශනා කර ප්‍රතිසංස්කරණවාදී ඉගැන්වීම්වලට ප්‍රතිචාර දැක්වීම මොවුන්ගේ සේවාව විය.
- ශු.සභාව තුළ ප්‍රතිසංස්කරණ ඇති කරලිමට ක්‍රම කෙක් වින්සේන්තියානු නිකායය විසින් අනුගමනය කරන ලදි.

    1. පැවිදි නිකායයන් සංවිධානය කර ආදර්ශවත් පූජකවරුන් බිහි කිරිම.
    2. ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාවේ ඉගැන්වීම් අනුව පූජකවරුන් බිහි කිරිමේ වගකීම පැවිදි නිකායයන්ට ලබා දීම

- ශුද්ධ වූ වින්සෙන්ති පාවුලා තුමා විසින් 1633 වින්සන්ට් ද පාවුලු මුනිතුමාගේ දයාවේ සොහොයුරියන්ගේ නිකාය ද (Sister of Charity St. Vincent De Paul) ආරම්භ කරන ලදි.

**ජේසු නිකාය**

- සභා ප්‍රතිසංස්කරණවාදී පසුබිමක බිහි විය.
- ලොයලාහි ශුද්ධ වූ ඉග්නාසියුස් තුමන් විසින් ක්‍රි.ව. 1533 ආරම්භ කරන ලදි.
- එතුමා යුද වැදි තුවාල ලැබ ප්‍රතිකාර ලබමින් සිටි කාලය තුළ කියවීමට ලද ශුද්ධ ලියවිල්ල හා ශුද්ධවන්තයන්ගේ ජීවිත කථා තම ජීවිත පරිවර්තනයට හේතු විය.
- නූගත් ජනතාවට දිළිඳුනට අධ්‍යාපනය ලබා දිමේ අරමුණින් බිහිවූ මෙම නිකාය පසුව රාජ කුමාරවරුන්ට හා රජවරුන්ට ද අධ්‍යාපනය ලබා දිමට යොමු විය.
- වේදහාර රකිමින් කැප වූ ජීවිතයක් ගත කිරීමත් ශුද්ධෝත්තම පියතුමාගේ නියෝගවලට කීකරු වීමට පොරොන්දු වීමත් මෙම නිකායේ විශේෂ ලක්‍ෂණයකි.
- කතෝලික සභාවේ ධර්මවේදය උගන්වා ආරක්‍ෂා කර ගැනීම ජේසු නිකායික ධර්මදූතවරුන්ගේ කාර්යය විය.
- ප්‍රතිසංස්කරණ සභා බිහිවූ යුගයේ කතෝලික සභාවේ නවෝදය ජේසු නිකායික පූජා ප්‍රසාදින් වහන්සේලා විසින් ඉදිරියට ගෙන යන ලදි.
- අධ්‍යාත්මිකත්වයෙන් හා දේව ධාර්මිකත්වයෙන් පූර්ණ වූ මොවුන් අතරින් ශුද්ධ වූ ඉග්නාසියුස් තුමා විසින් රචිත " අධ්‍යාත්මික පුහුණුව " (Spiritual Exercise)

ග්‍රන්ථය ද ශුද්ධ වූ පීටර් කැනිෂියස් තුමන් විසින් රචිත ධර්මෝපදේශ ග්‍රන්ථ තුනද කතෝලික ධර්ම උපදේශයේ වර්ධනයට ඉවහල් වූ අතර ප්‍රතිසංස්කරණ වාදී සභාව තුල පවා ප්‍රශංසාවට ලක් වූ මෙය ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාවේ ඉමහත් පිළිගැනීමට ලක් විය.

- ජේසු නිකායික පියතුමෙකු වන ශුද්ධ වූ රොබට් බෙලාමියන් වැනි අය ත්‍රිදෙන්තිනු මන්ත්‍රණ සභාවේ දේව ධර්මාචාර්ය වරයකු ලෙස කටයුතු කලේය.

**ශුද්ධ වූ වින්සන්ට් ද පාවුලු තුමාගේ දයාවේ සොහොයුරියන්ගේ නිකාය**

- ශුද්ධ වූ වින්සන්ට් ද පාවුලාතුමා විසින් ක්‍රි.ව. 1633 දී වින්සන්ට් ද පාවුලු මුනිතුමාගේ දයාවේ සොහොයුරින්ගේ නිකාය. (Sister of Charity St. Vincent De Paul) ආරම්භ කරන ලදි.

**දලාසාල් නිකාය**

- ශාන්ත ජෝන් බැප්ටිස්ට් ද ලාසාල් මුනිතුමා මෙම නිකායේ නිර්මාතෘ වරයාය.
- ප්‍රංශයේ රෙයිම්ස් නගරයේ පිහිටි ආසන දෙව්මැදුරේ මිසම් සේවක පියතුමා වශයෙන් කටයුතු කරන සමයේ දී එතුමා ප්‍රංශයේ දිළිඳු පිරිමි ළමයින්ට අධ්‍යාපනය ලබා දීමේ අරමුණින් ක්‍රි.ව. 1680 දි පූජක නොවන අයගෙන් සමන්විත දලාසාල් නිකාය ආරම්භ කළේය.
- දිළිඳු දරුවන්ට නොමිලේ අධ්‍යාපනය ලබා දීම, නව ඉගැන්වීම් ක්‍රම හදුන්වාදීම අරමුණ විය.
- කිතුනු ගුරුවරුන්ගේ නාම සාන්තුවරයා වන්නේ ජෝන් බැප්ටිස්ට් ද ලාසාල් මුනිතුමාය.

**(නිකායන් 05 ක් කෙටියෙන් විස්තර කර ඇත් නම් ලකුණු 05 යි)**

II **ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව විසින් ඉදිරිපත් කරන ලද නවෝදයේ ව්‍යාපෘති**

- පූර්ණඵල පිළිබඳ දේශණා කිරීම අත්හිටුවීම
- මරියතුමියට හා ශුද්ධවන්තයන්ට නියමිත පරිදි ගෞරව දැක්වීමට උනන්දු කරවීම
- පූජක පුහුණුව සඳහා සෑම පදවියකට දෙව්සත්හලක් ආරම්භ කිරීම
- දිව්‍ය සත්ප්‍රසාදය ලබාගැනීමට උනන්දු කිරීම
- නිතර නිතර සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලබා ගැනීමට උනන්දු කර වීම
- දිව්‍ය සත්ප්‍රසාදය වන්දනාව හා දිව්‍ය සත්ප්‍රසාද ආශීර්වාදය ලබා ගැනීමට උනන්දු කර වීම

**(මෙවැනි ව්‍යාපෘති 05 නම් කිරීමට ලකුණු 05)**

**නවෝදයේ ව්‍යාපෘති ශිෂ්‍යයාගේ ආධ්‍යාත්මික වර්ධනයට රුකුලක් වන ආකාරය**

- තමන් කරනු ලබන පව්වලට අවංකව මනස්ථාපනය වී යහපත් සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානයට (පාපොච්චාරණයක්) ඇතුළු වීමෙන් පව්

සමාව ලබාගත හැකිය.

- තුන්දෙනා වහන්සේලා (පීතෘ වහන්සේ, පුත්‍රයාණන් වහන්සේ, ශුද්ධාත්මයාණන් වහන්සේ) හා සාන්තුවරයන් අතර ඇති වෙනස අවබෝධ කර ගැනීමටත් ඒ තුළින් දෙවියන් වහන්සේටත් මරිය තුමියටත් ශුද්ධවන්තයන්ටද නියමිත පරිදි ගෞරව දැක්වීමට උනන්දුවක් මේ තුළින් ඇති වීම.
- දෙව්සත්හල්වල පැවැත්වෙන දේව කැඳවීමේ කඳවුරුවලට සහභාගිවීමට අවස්ථාව ලැබීමෙන් තමන්ටත් ඒ සඳහා කැඳවීමක් ඇත්දැයි සිතා බලා තීරණ ගැනීමට අවස්ථාව ලැබීම.
- බිඳ වැටුණු දේව සබඳතාව යලි ගොඩනගා ගැනීමට නිතර නිතර සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලබා ගත යුතුය.මේ සඳහා මඟ පෙන්වීමටත් මෙ තුළින් ලැබේ.
- දිව්‍ය සත්ප්‍රසාදය තුළ ජීවමානව ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ වැඩ සිටියි.මේ නිසා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේව ලබා ගැනීමට නිසි ශාරීරික හා ආධ්‍යාත්මික සූදානමක් තිබීම.
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරියේ ගෞරවාන්විතව හැසිරීමට හා නිසි වන්දනාව ලබා දීමට අප යොමුවිය යුතුය.
- ස්වාමින් වහන්සේ මෙන් අප ජීවිත කැඩී බිඳීම හෙවත් පරිත්‍යාගය හා කැපවීම අවශ්‍ය වේ.මේ සඳහා දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව හා දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය ලබා ගැනීමට උනන්දු කරවීම අධ්‍යාත්මික ජීවිතය වර්ධනයට රුකුලක් වේ.

**(මෙවැනි කරුණු ඔස්සේ ඉහතින් සඳහන් කරන ලද නවෝදයේ ව්‍යාපාති ශිෂ්‍යයාගේ ආධ්‍යාත්මික වර්ධනයට රුකුලක් වන ආකාරය කෙටියෙන් විස්තර කර ඇත්නම් ලකුණු 5යි.)**